# ගම්පහ මහා නගර සභාව

# ගම්පහ දිස්ත්‍රික්කය

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2013 අප්‍රේල් 01 දිනද, ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 30 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2014 ජනවාරි 09 දින සභාවේ නගරාධිපතිවරයාට යවා ඇත.

1.2 **මතය**

මාගේ වාර්තාවේ දක්වා ඇති අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් හේතුකොට ගෙන විගණනය සඳහා ඉදිරිපත් කර ඇති ගම්පහ මහා නගර සභාවේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි.

1.3 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

1.3.1 **ගිණුම්කරණ අඩුපාඩු**

(අ) සමාලෝචිත වර්ෂයේ රු.1,500,000 ක් වැයකර ට්‍රැක්ටර් 2 ක් හා ටේලර් 2ක් මිලදී ගැනීම ස්ථාවර වත්කම් යටතේ දක්වා නොතිබුණි.

(ආ) පෙර ගෙවුම් ශේෂය තුළ එකතුව රු.62,833 ක් වටිනා අගරු චෙක්පත් 6 ක් නිරවුල් කිරීමකින් තොරව පැවතුණි.

(ඇ) ආපදා කළමනාකරණ අධිකාරියෙන් ලද අගුල් 02, එන්ජම සහිත බෝට්ටු 01 හා ජෙනරේටරයේ වටිනාකම තක්සේරුකර ගිණුම් වලට ගෙන නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ ප්‍රතිපාදන සලසා තිබූ වටිනාකම රු.35,500,000 ක් වූ ක්‍රියාකාරකම් 3 ක් සම්බන්ධව ගිවිසුම්ගත බැඳීමක් හෝ කිසිදු කාර්යයක් සිදුකර නොමැතිව තිබියදී ඒවා වර්ෂය අවසානයට ණයහිමියන් ලෙස ගිණුම්ගතකර තිබුණි.

1.3.2 **විගණනය සඳහා සාක්ෂි නොවීම**

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.134,756,437 ක්වූ ගනුදෙනු විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

2. **මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

2.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.34,986,801ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.30,953,942 ක් විය.

2.2 **ආදායම් පරිපාලනය**

2.2.1 **ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්**

නගරාධිපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාළව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000" | රු.000" | රු.000" |
| (i) | වරිපනම් හා බදු | 47,396 | 36,762 | 27,291 |
| (ii) | බදුකුලී | 13,332 | 12,809 | 18,095 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 1,208 | 1,292 | 546 |
| (iv) | වෙනත් ආදායම් | 162,605 | 150,027 | 58,645 |

2.2.2 **වරිපනම් බදු**

2012 දෙසැම්බර් 31 දිනට හිඟ වරිපනම් බදු රු. 25,840,902 ක ශේෂය තුළ රු.5,000 ඉක්මවූ ශේෂවල වටිනාකම රු.2,203,399 ක් විය.

2.2.3 **වෙනත් ආදායම්**

හිඟහිටි වෙනත් ආදායම් රු.123,591,651 න් ගම්පහ ප්‍රධාන කාර්යාලයට අයත් බල ප්‍රදේශය තුළ පමණක් වසර 1-3 ත් අතර හිඟ ශේෂයන්ගේ එකතුව රු.6,950,334 ක්ද, වසර 3-5 ත් අතර හිඟ ශේෂයන්ගේ එකතුව රු.4,107,844 ක්ද, වසර 5 ඉක්මවූ හිඟ ශේෂයන්ගේ එකතුව රු.4,728,852 ක්ද, විය.

2.2.4 **උසාවි දඩ**

2012 දෙසැම්බර් 31 දින වන විට ගම්පහ අධිකරණයෙන් උසාවි දඩ මුදල් අයකර ගෙන තිබුණේ 2007 වර්ෂය දක්වා පමණි.

2.3 **නිශ්ක්‍රීය හා ඌන උපයෝජිත භෞතික සම්පත්**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාව සතු වර්ෂ 06 කට අධික කාලයක සිට අභාවිතව පැවති අපහරණයට හෝ අළුත්වැඩියා කර භාවිතයට ගැනීමට කටයුතු නොකර දිරාපත්වෙමින් පැවතුණු වාහන 6 ක වටිනාකම රු.909,100 ක් හා අභාවිතව පැවති කාලය හඳුනාගත නොහැකි යන්ත්‍රසූත්‍රවල වටිනාකම රු.789,760 ක් විය.

(ආ) 2010 ජනවාරි 26 දින සිට ධාවනය කළ නොහැකි තත්ත්වයේ පැවති ජල බවුසරය 2013 ජූනි 10 විගණිත දිනය වන විටත් අළුත්වැඩියා කිරීමකින් තොරව අනාරක්ෂිතව සහා භූමියේ ගාල්කර තිබුණි.

(ඇ) සභාව සතු කඩ කාමරවලින් කඩ කාමර 45 ක් ටෙන්ඩර් කිරීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි.

2.4 <u>ආර්ථිකමය නොවූ ගනුදෙනු</u>

පහත අවස්ථා නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) නගරාධිපතිවරයා විසින් භාවිතා කරන ලද නිල රථය හදිසි අනතුරකට ලක්වීම ඉක්මනින් අළුත්වැඩියා කිරීමට හැකියාව තිබියදීත් අළුත්වැඩියා කිරීමට ප්‍රමාදවීම හේතුකොට ගෙන නගරාධිපතිවරයාගේ පෞද්ගලික රථය භාවිතා කිරීම හේතුවෙන් ඒ සඳහා රු.675,000 ක් ගෙවා තිබුණි. එසේම ගිනි නිවීමේ අංශයට යොදවා ඇති කැබ් රථය නගරාධිපතිගේ රාජකාරි සඳහා කි.මී.6275 ක් ධාවනය කර තිබූ අතර ඒ සඳහා රු.103,088 ක වියදම ක් දරා තිබුණි.

(ආ) විධිමත් අධිකාරි අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂය තුළදී නාගරික මන්ත්‍රීවරුන් සඳහා නගරාධිපති අනුමැතිය මත සැතපුම් කුලිය ලෙස රු.948,350 ක් ගෙවා තිබුණි. සභාවේ කාර්මික නිලධාරීන්, සෞඛ්‍ය පරීක්ෂකවරුන් සහ කර්මාන්ත පරිපාලකවරුන්ට අයත් රාජකාරි වන විමධ්‍යගත ව්‍යාපෘති අධීක්ෂණය, පළාත් පාලන උපමාන ප්‍රදාන ව්‍යාපෘති අධීක්ෂණය කිරීම, විථිපහන් නඩත්තු අධීක්ෂනය, මාර්ග හා කාණු පද්ධතිය නඩත්තු කිරීම යන රාජකාරි ඉටු කිරීම වෙනුවෙන් මෙම සැතපුම් කුලිය ගෙවා ඇති බවත් ඉටු කිරීමට නියමිත කාර්යයන් සම්බන්ධ පූර්ව සැලැස්මක් සභාව විසින් තීරණය කර හෝ ඉටු කරන ලද රාජකාරි සම්බන්ධව කාර්ය සාධන වාර්තාවක් සභාවට ඉදිරිපත් කර හෝ නොතිබුණි

(ඇ) පිටස්තර වාහන, කුලියට ලබා ගැනීමට 2012 ජනවාරි සිට 2013 ජූනි දක්වා වැය කරන ලද රු.5,569,356 න් ට්‍රැක්ටර් හා ත්‍රිරෝද රථ මිලට ගත්තේ නම් සභා අරමුදල් පිටතට යාම වැළැක්වීමට හා ඒවා ඉදිරි කටයුතු වලදී ප්‍රයෝජනයට ගැනීමට හැකිව තිබුණි.

2.5 <u>අධිකාරි බලය නොලත් ගනුදෙනු</u>

පහත අවස්ථා නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) නගර සංවර්ධන ව්‍යාපෘතිය යටතේ කොළඹ බස් නැවතුම්පොලේ ඉදිකරන ලද කඩ කාමර 51 ක් පිළිබඳ ප්‍රධාන තක්සේරුකරුගේ වාර්තාව 2008 මැයි 23 සහ 2008 ජූනි 23 දිනැතිව සභාවට ලබාදී තිබුණි. නව තක්සේරු කුලිය ගෙවන ලෙස බදුකරුවන්ට දැනුම් දී තිබූ අතර විරෝධතා මතුවුයේයයි දක්වමින් තක්සේරු කුලිය අඩුකර නව තක්සේරුව අනුව බිල්කර ඇති මුදල් ලේඛනයෙන් කපා හැරියයුතු බවට මහා සභා අනුමැතිය මත 2008 අගෝස්තු 01 සිට 2009 ජූලි 31 කාලයට අදාලව රු.1,768,500 ක් 2009 වර්ෂයේදී අංක 17 දරන ජනල්

සටහන මගින් කපාහැර තිබූ අතර ඒ සඳහා මහ නගර සභා ආඥා පනතේ 266(අ) වගන්තිය ප්‍රකාර අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. 2013 මාර්තු 04 දිනැති පළාත් පාලන කොමසාරිස්ගේ අංක එල්ජීඩී/06/02/04/එම්06 දරන ලිපිය අනුව විධිමත් පරිපාටියෙන් බැහැරව එසේ ක්‍රියාත්මක කිරීම පිළිබඳව හේතු පැහැදිලි කර දක්වන ලෙසත් නොපමාව අදාළ මුදල් අයවියයුතු මුදල් වශයෙන් ලේඛන යටතට ඇතුළත්කර ඒ අනුව ඉදිරි ක්‍රියාමාර්ග ගන්නා ලෙසත් දන්වා ඇතත්, 2013 ජුනි 28 දිනවන විටත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) 2012 මාර්තු 21 දිනැති අංක එල්ජීඑම්/05/19 දරන බස්නාහිර පළාත් ප්‍රධාන අමාත්‍යවරයාගේ ලිපියෙහි (ආ) ඡේදය ප්‍රකාරව නගරාධිපතිවරයාගේ නිල වාහනයට යොදන උපරිම ඉන්ධන ප්‍රමාණය කවර ප්‍රමාණයක්ද යන්න පූර්වයෙන් සභාව සම්මත කරන ලද යෝජනා සම්මුතියක් මගින් තීරණය කළයුතු බව දක්වා ඇතත්, එසේ පූර්ව සම්මත කිරීමකින් තොරව 2012 වර්ෂයේදී නගරාධිපතිගේ වාහනය සඳහා රු .1,205,663 ක ඉන්ධන වියදම ක් දරා තිබුණි.

2.6 <u>යක්කල සාප්පු සංකීර්ණය ඉදිකිරීම</u>

මෙම සාප්පු සංකීර්ණය ඉදිකිරීම සඳහා නගර සභාව සහ කොන්ත්‍රාත්කරු අතර 2008 දෙසැම්බර් 22 එළඹි ගිවිසුම අනුව ගිවිසුම්ගත මුදල රු.96,960,742 (බදු රහිත) ක් වූ අතර ගිවිසුම් කාලය මාස 9 ක් විය. පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) විගණිත දිනය වූ 2013 ජුනි 28 දින වන විට ගිවිසුම්ගතවී වසර 3 කටත් අධික කාලයක් ගතවී ඇතත් වැඩ අවසන් කර තිබුණේ ඉතා සුළු ප්‍රමාණයකි.

(ආ) 20% අත්තිකාරම් මුදල සහිතව අවස්ථා 5 කදී සභාව විසින් රු.43,497,091 ක මුදලක් කොන්ත්‍රාත්කරුට ගෙවා තිබුණි. වසර ගණනාවක් තිස්සේ මෙම ව්‍යාපෘතිය ප්‍රමාදවීම හේතුවෙන් දරන ලද වියදමෙන් නිසි පයෝජනයක් ලබා නොමැති බව නිරීක්ෂණය කෙරේ.

(ඇ) 20% අත්තිකාරම සඳහා ඉදිරිපත් කර තිබූ බැංකු ඇපකරය 2010 පෙබරවාරි 24 දින අවසන් වුවත් 2013 ජුනි 28 වන විටත් වලංගු කාලය දීර්ඝ කිරීමට පියවර ගෙන නොතිබුණි.

(ඈ) ඉදිකිරීම් කර්මාන්තයේ ප්‍රමාද වීම මත ඉතිරි වැඩ කොටස් නිම කිරීම සඳහාත් 20% ක මිල වැඩි කිරීමටත් 2012 පෙබරවාරි සිට මිල විචලනය අනුව ගෙවීමටත් සභාව තීරණය කර තිබූ අතර, ඒ අනුව 20% මිල වැඩිවීම මත රු.1,037,027 ක්ද, මිල විචලනය රු.160,927 ක් වශයෙන් එකතුව රු.1,197,954 ක් වැඩිපුර ගෙවීම සභාවට සිදුවූ පාඩුවක් බව නිරීක්ෂණය විය.

(ඉ) 2012 අප්‍රේල් 5 දින පැවති මහා සභා රැස්වීමේදී ඉතිරි වැඩ කොටස් සඳහා නිශ්චිත කාලයක් සහිතව නව ගිවිසුමක එළඹීමට සභාව තීරණය කර ඇතත් 2013 ජුනි 28 වන විටත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඊ) 2013 ජුනි 28 දින කරන ලද භෞතික පරීක්ෂාවේදී ඉදිකිරීම් කටයුතු නවතා දමා ඇති බවත්, භූමිය වල් බිහිවී ඇති බවත්, පළමු මහළ ඉදි කිරීමට නියමිත කඩ කාමරවල කම්බි සොරුන්

විසින් කපාගෙන ගොස් ඇති බවත්, ඉදිකර ඇති කඩ කාමරවල ජල කාන්දුවීම් සිදුවන බවත් ඉදිකර ඇති කඩ කාමර විවිධ අපචාර සඳහා යොදා ගැනිමට ඉඩ ඇති බවත් නිරීකෂණය විය.

2.7 **කාර්යාල කටයුතු පරිගණකගත කිරීම**

සභාවට අවශ්‍ය කරන කාර්යාල කටයුතු පරිගණකගත කිරීම සඳහා අවශ්‍ය මෘදුකාංග පද්ධති ලබාගැනිම සඳහා පෞද්ගලික ආයතනයකට රු.1,637,000 ක් සමාලෝචිත වර්ෂයේ ගෙවා තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.9 ජේදය ප්‍රකාරව ටෙන්ඩර්කරුට විධිමත් ප්‍රතිග්‍රහණ ලිපියක් නිකුත් කර නොතිබුණි.

(ii) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.8 ජේදය ප්‍රකාරව කාර්ය සාධන සුරක්ෂිතයක් තබාගෙන නොතිබුණි.

(iii) ඉදිරිපත්කර ඇති මිල ගණන් පත්‍රය අනුව මෘදුකාංගය මිලදී ගැනීමට ගිවිසුම්ගත වීමේදී 25% ක්ද, මෘදුකාංග පද්ධතිය ස්ථාපිත කිරීමෙන් පසු 25% ක්ද, පුහුණුව අවසන් වීමෙන් පසු 50%ක්ද ගෙවියයුතු වුවත්, 2012 දෙසැම්බර් 31 දින වන විට රු.1,318,500 ක මුදලක් ගෙවා තිබුණි. පද්ධතිය ස්ථාපිත කිරීම සම්බන්ධව රජයේ මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.12 වගන්තිය අනුව වැඩ අවසන් කිරීම පළිබඳ සහතිකයක් නොවූ අතර, 2013 ජුනි 28 විගණිත දිනය වන විටත් අදාළ නිලධාරීන් පුහුණුවීම් කර ඇති බවක් ද, නිරීක්ෂණය නොවීය. ඒ අනුව පුහුණුවෙන් පසු ගෙවියයුතු මුදල් පුහුණුවට පෙර ගෙවා ඇති බව නිරීක්ෂණය විය.

(iv) ගිවිසුම්ගත දිනයේ සිට මේ දක්වා වසරකට අධික කාලයක් ගතවී ඇතත් සභාවේ පරිගණක මෘදුකාංගය ක්‍රියාත්මකව තිබුණේ වරිපනම් හා වෙනත් ආදායම් සඳහා පමණි. අනෙකුත් අංශ ක්‍රියාත්මකවීම මූලික අදියරේ පැවතුණි.

2.8 **වාහන උපයෝජනය**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සභාව සතුව වාහන 42 ක ඇණියක් පැවති අතර, එහි ධාවනයේ නොයෙදෙන වාහන 10 ක් වසර 6 කට වඩා කාලයක සිට ගාල්කර තිබුණි.

(ආ) වාහන භාරව නිලධාරියෙකු නොසිටි අතර, ඒ ඒ අංශ විසින් විවිධ කාර්යයන් සඳහා වාහන යොදාගෙන තිබුණ බවත් නිසි අභ්‍යන්තර පාලනයක් ක්‍රියාත්මකව නොතිබුණි.

2.9 **පාරිසරික හා සමාජ වගකීම් ඉටුකිරීම**

(අ) **කසළ අපහරණය කිරීම**

2012 වර්ෂය තුළ කසල බැහැර කිරීම වෙනුවෙන් පෞද්ගලික ආයතනයකට රු.5,008,922 ක්ද, බදු ඉඩම වෙනුවෙන් රු.700,000 ක් සහ කසල දැමීම වෙනුවෙන් රු.3,825,000 ක්ද වශයෙන් රු.9,533,922 ක් බාහිර පාර්ශව වෙත ගෙවා තිබුණි. ඊට අමතරව මෙම කාර්යය සඳහා යොදවාගත් සභාවේ වාහන සඳහා රු.3,357,887 ක ඉන්ධන හා නඩත්තු වියදම්ද කුලියට ගත් වාහන සඳහා වසර තුළ ගෙවීම රු.3,970,570 ක්ද විය.

(ආ) මහා නගර සභා ආඥා පනතේ 130 වගන්තිය ප්‍රකාරව කසළ සභාවේ දේපළක් වන හෙයින් ඒ ගැන සැළකිලිමත්වී කසළ ජනනය වන ස්ථානවලදීම වර්ගීකරණය කරවා එසේ වර්ගීකරණය කරන ලද ද්‍රව්‍ය සුදුසු පරිදි ප්‍රතිචක්‍රීකරණය කිරීමට හෝ කොම්පෝස්ට් පොහොර නිෂ්පාදනය සඳහා යොමු කිරීමට සභාව අපොහොසත්වීම නිසා සභාවේ දේපළක් වන කසළ බැහැර කිරීම සඳහා ඉහත පරිදි විශාල මුදලක් වැය කිරීමට සභාවට සිදුවී තිබුණි.

2.10 **කාර්ය මණ්ඩල පරිපාලනය**

2012 දෙසැම්බර් 31 දිනට මහා නගර සභාවේ අනුමත සහ තථ්‍ය සේවක සංඛ්‍යාව පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| තනතුරු වර්ගය | අනුමත | තථ්‍ය | පුරප්පාඩු/ අතිරික්ත |
|---|---|---|---|
| මාණ්ඩලික | 05 | 05 | - |
| ද්වීතියික | 128 | 106 | 22 |
| ප්‍රාථමික | 187 | 139 | 48 |
| කොන්ත්‍රාත් | - | 77 | - |

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) නාගරික කොමසාරිස් තනතුර 2005 ජනවාරි මාසයේ සිට පුරප්පාඩු වී තිබුණු අතර, ඒ සඳහා 2011 සිට කොන්ත්‍රාත් පදනම මත මාස 6 න් 6 ට සේවය දීර්ඝ කරමින් විශ්‍රාම ගිය නිලධාරියෙකු බඳවාගෙන තිබුණි.

(ආ) ද්වීතියික ශ්‍රේණියේ අදායම් පරීක්ෂක තනතුර සහ ගිනි නිවීම් අංශයේ තනතුරු 10 ක පුරප්පාඩු පිරවීමට සභාව විසින් කටයුතු සිදුකර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුළදී ප්‍රාථමික කාර්ය මණ්ඩලය සඳහා කොන්ත්‍රාත්/ අනියම් පදනම මත සේවයේ යෙදවීම වෙනුවෙන් 77 දෙනෙකු සඳහා රු.10,259,980 ක් ගෙවා තිබුණ ද සේවයට වාර්තා කිරීම සම්බන්ධව පැමිණීමේ ලේඛනයක් පවත්වා නොතිබුණි.

සෞඛ්‍ය අංශයේ වැඩ පැවරීමේ වාර්තාවල සඳහන් නොමැති සේවකයින් සඳහා වෙක්රෝල් සකසා ඇතිබව කරන ලද නියැදි පරීක්ෂාවට අනුව අනාවරණය විය.

| මාසය | සේවක සංඛ්‍යාව | දින ගණන |
|---|---|---|
| 2012 ජනවාරි | 21 | 164 |
| පෙබරවාරි | 22 | 193 |
| සැප්තැම්බර් | 16 | 52 |

3. <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අභ්‍යන්තර විගණනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) වත්කම් කළමනාකරණය
(ඉ) වාහන උපයෝජනය